# ඊලාම් යුද්ධය හා සොල්දාදුවන්ගේ මානසික සෞඛ්‍යය

අවසාන කොටස



> ."මරණයට ඍජුවම මුහුණදෙමින් සිටින අයට එය වික්‍රමාන්වත ක්‍රියාවක් නොවේ."
> එරික් මරියා රිමාකේ- "බටහිර පෙරමුණෙ නිසලය" කෘතියෙන්

වෛද්‍ය රුවන් එම්. ජයතුංග

## සතුරා මරාදැමීමෙන් පසු ඉන් හෙම්බත්වූ යුද සෙබලා

සටන්කාමී බවක් පෙන්වමින් වසර 10 කට ආසන්න කාලයක් තිස්සේ, සාජන්ට් Sx78 මෙහෙයුම් පැවති ප්‍රදේශවල සේවය කලේය. යාපනේ කොටුව ආරක්‍ෂා කර ගැනීමේ සටන් වලදී ඔහු අතිදරුණු සිද්ධීන් වලට මුහුණ පෑවේය. යාපන කොටුව අත්පත් කරගන්නා ලද අවස්ථාවේදී සතුරා බර අවිවලින් ඔවුනට පහර දුන්නේය. කොටුව තුල (midnight express) මෙහෙයුම දියත් කරන ලදී. මුහුණට මුහුණලා කළ සටනකදී ඔහු විසින් සතුරු සාමාජිකයින් පස් දෙනෙකු මරා දමන ලදී. වසර ගණනාවකට පසුව එම මරාදැමීම් සම්බන්ධ වූ සිතුවිලි ඔහුගේ සිතෙහි ප්‍රබල ලෙස බලපවත්වන්නට විය. ''ඔවුන් අප මාරාදැමීමට පැමිණි නමුදු ඔවුන් ද මනුෂයයින් වේ'' යනුවෙන් සාජන්ට් Sx78 පවසයි.

''ඔවුහු ජීවිතයේ බොහෝ විකල්පයන් නොමැති වූ අප වැනි දිළිදු ගැමි දරුවන් වූහ.''ඔවුන් බොහෝ කලක් තිස්සේම නොමග යවන ලදුව වෛරය නමැති විෂ පොවා අපට පහරදෙන ලෙසට නියෝග ලබා තිබුනි.'' ඔවුන්ට වෙඩි තබනු හැර අපට අන් විකල්පයක් නොවීය. යුද්ධයකදී තත්ත්වය අති දරුණු වන අතර, එක්කෝ ඔබ නැත්නම් සතුරාය. ඔබ ඔවුන් මරා නොදැමුවේ නම් ඔවුන් ඔබ මරා දමනු ඇත. කෙසේ වෙතත් මෙම දෙමළ තරුණයින්ට ද අපට මෙන්ම දෙමාපියන් සිටි අතර ඔවුන්ටද අපේක්‍ෂාවන් තිබෙන්නට ඇත. සියල්ල දුකසේ නිමාවිය. කොතැනක කවුරු හෝ ඔවුන් එනතුරු බලා සිටිනු ඇත. පරපණ නැසීම නුසුදුසු බැව් මම දනිමි. එය බෞද්ධ ධර්මය අනුව ප්‍රථම සිල්පදය කැඩීමකි. එහෙත් එම ක්‍රියාව මට නොකරම බැරිවිය.

තමන්ට කවදා හෝ කර්මය එලදීමකට මුහුණදීමට සිදුවන බව සාජන්ට් Sx78 විශ්වාස කරයි. ඔහුගේ හෘද සාක්‍ෂිය දෙදරා ගිය අතර පසුව ඔහු වඩාත් ආගමික පැත්තට නැඹුරු විය. යුද හමුදාවෙන් විශ්‍රාම ගිය පසුව මහණදම් පිරීමට යාමට ඔහු කැමැත්තෙන් සිටී.

## යුද්ධයේ අවසන් දින කිහිපය :

ලුතිනන් කර්නල් ......... මෙහෙයුම් රැසකට සහභාගී වූ අත්දැකීම් බහුල ක්ෂේත්‍ර නිලධාරියෙකි. ඊලාම් යුද්ධයේ අවසන් දින කිහිපය තුලදී අත්දුටු අත්දැකීම් ඔහු බෙදාගත්තේ මෙසේය.

" අප විසින් තොප්පිගල මුදාගනු ලැබීමෙන් පසුව අප අපරාජිත බව මම දැනගතිමි. අනෙකුත් අයට ද එය එසේම දැනෙන්ට ඇත. එබැවින් අපි ඉදිරියට ගමන් කළෙමු. ඊලාම් යුද්ධයේ අවසන් අදියර ඉතාම අවුල් සහගත විය. බඹඹෑය විසින් විශාල වැලි බැම් ඉදිකොට තිබී අතර දරුණු වෙඩි තැබීම් වලින් පසුව ඒවා පසාරු කරගෙන යා නොහැකි විය. මිනිස් පලිහක් නිර්මානය කරමින් ඔවුහු සිවිල්වැසියන් අතරේ සිටියහ. සිවිල් වැසියන්ට අනතුරු නොවෙන ආකරයට අප වැඩිමනත් ලෙස ප්‍රවේසම් විය යුතු විය.

කෙසේ වෙතත් යුද්ධයකදි සිවිල් වැසියන් හට අනතුරු සිදුවිම නොවැලැක්විය හැකිය. එක්සත් ජනපද හමුදා විසින් සතුරාට ප්‍රතිප්‍රහාර දුන් අවස්ථාවේදී ඉරාකයේ හා ඇප්ගනිස්ථානයේ සිවිල් වැසියන් කෙතරම් සංඛ්‍යාවක් මිය යන්නට ඇත්ද? එහෙත් සිවිල් වැසියන් පිළිබඳ ප්‍රශ්නය නිසා සතුරන් පහරදුන් විට අපගේ සෙබලුන් ප්‍රතිප්‍රහාර දීමෙන් වැලකි සිටි අවස්ථාවන් මට මතක ඇත. මෙම කරුණු ගැන පිටස්තර ලෝකයා කිසි දිනෙක දැන නොගනු ඇත.

බන්කරයක සිට සතුරා පහරදුන් අවස්ථාවක් මට මතක ඇත. ටොම්බා තුවක්කුවකින් එම බන්කරයට පහරදීමට අපගේ එක් සෙබලෙකු තැත් කළේය. එහෙත් බන්කරය අසල සිවිල් වැසියන් සිටින බව පවසමින් තවත් සෙබලෙකු ඔහුව වැලැක්වීය. සිවිල් වැසියන් අනතුරට භාජනය නොකර, බන්කරය විනාශ කිරීමට වෙනත් ක්‍රමයක් සොයා ගැනීමට ඔවුනට සිදුවිය.

***තවත් අවස්ථාවකදී වැලි කන්දක් කඩාගෙන සිවිල් වැසියන් අප වෙත එද්දී අපගේ සෙබලුන් කුඩා දෙමළ ළමුන් ඔසවාගෙන එනු මම දුටුවෙමි. මෙම මානුෂවාදී ක්‍රියාවන් ගැන කිසි දිනෙක නොකියැවුනු අතර අවධාරණය කෙරෙන ලද්දේ අසුබවාදි කරුණු ගැන පමණි.***

තවත් අවස්ථාවකදී වැලි කන්දක් කඩාගෙන සිවිල් වැසියන් අප වෙත එද්දී අපගේ සෙබලුන් කුඩා දෙමළ ළමුන් ඔසවාගෙන එනු මම දුටුවෙමි. මෙම මානුෂවාදී ක්‍රියාවන් ගැන කිසි දිනෙක නොකියැවුනු අතර අවධාරණය කෙරෙන ලද්දේ අසුබවාදි කරුණු ගැන පමණි.

යුද්ධයකදී ම්ලේච්ච ක්‍රියාවන් නිතර සිදුවන බවට මම එකඟ වෙමි. එමෙන්ම සැම හමුදාවකම එහ ඕසසංහාරය සිදු කළවිලියම් කැලී වැනි මිනිසුන් දැකිය හැකි බවද පිළිගනිමි. මාධ්‍ය හරහා යුද්ධයේ ම්ලේච්ඡත්වය ගැන මෙන්ම මානුෂික ක්‍රියාවන් සම්බන්ධයෙන්ද වාර්තාකල යුතු බව මම පෞද්ගලිකවම සිතමි. නැතහොත් කිසිම තැනකදී ප්‍රතිසන්ධානයක් ඇති නොවනු ඇත. අන්තිමේදී බලන කල මිනිසා මුලුමනින් දුෂ්ට නොවේ.

මා වසර කිහිපයක්ම යුද්ධය සමග ජීවත්ව ඇත. සෙබලුන්ගේ නරක්වු සිරුරු හා මියගිය LTTE සාමාජිකයන්ද මම දැක ඇත්තෙමි. මම සියලු පුද්ගලයින් අපේ මේ භූමියේ පුතුන්ය. යුද්ධයේ අවසන් දින කිහිපය අතිශය කම්පනය ගෙන දෙන සුළු විය. මානව දුක් පීඩාවන් දෑසින් දුටුවෙමි. මා ඇති තරම් ලේ දුටුවෙමි. සැපට කොළඹ සිට යුද්ධය වෙනුවෙන් ආවඩන පුද්ගලයින් මෙහි සිටිය යුතුව තිබ්න. යුද්ධය යනු ඇත්තෙන්ම කුමක්දැයි එවිට ඔවුන් වටහා ගනු ඇත.

මිරිගුවක් පසුපස හමාගිය දෙමළ සිවිල් ජනතාවට මම අනුකම්පා කළෙමි. පාසල් ශිෂයයෙකු ලෙස 16 හැවිරිදි වියේදී මා ප්‍රථම වරට යාපනයට පැමිණි විට දෙමළ ජනතාවගේ කරුණාවන්ත භාවය මම දුටිමි. යාපනේ වැසියක් උගත් හා සංස්කෘතිය රකින පිරිසක් විය. ප්‍රචණ්ඩකාරීත්වයෙන් බැහැරව පෝෂනය වූ ශ්‍රේෂ්ඨ ශිෂ්ඨාචාරයක් ඔවුන්ට තිබ්න. 1970 මුල් භාගයේදී ගැටුම් පැන නැගී විට එය ඉතා දැඩි ලෙස වෙනස් විය. එවි මා හට ආපසු උතුරට පැමිණීමට සිදුවූයේ යුද්ධයේ ආම්පන්න සමඟය.

උතුරේ දෙමළ ජනතාවට යුද්ධය හේතු කොට ගෙන මිලකල නොහැකි අන්දමේ වටිනාකම් අහිමි කරනු ලැබීය. ඔවුන්ගේ දේපල විනාශ විය. ළමුන් බලාත්කාරයෙන් බඹඹෑට බදවා ගන්නා ලදී. ඔවුන් මරණය හා පූර්ණ ාබිඳවැටීමටද මුහුණ දුන්නේය. ඔවුන්ට දිළිදු බවින් යුතුව දිවිගෙවීමට සිදුවිය. දෙමළ ඩයස්පෝරාව හා අනෙකුත් රාජ්‍ය නොවන සංවිධාන මගින් උතුරට පොම්ප කරන ලද ඩොලර් මිලියන ගණන් වලට කුමක් සිදුවීද? වන්නියේ ජනතාවට යටිතල පහසුකම් නොතිබිනි. ජනතාව මන්දපෝෂණයෙන් පෙලුනි. එම මුදල් උතුර සංවර්ධනය කිරීම සඳහා යෙදුවේ නම් මේ වන විට කුඩා සිංගප්පූරුවක් එහි ගොඩනැංවීමට ඉඩ තිබුණි.

යුද්ධය නිමාවීම ගැන මම සතුටු වෙමි. අප විසින් දැන් උතුර පුනරුත්ථාපනය කොට, ජාතීන් අතර සාමකාමී සහජීවනයක් ඇති කිරීමට ක්‍රියා කළ යුතු වේ. අපගේ නොවැදගත් වර්ගවාදී වෙනස්කම් අමතක කොට දෙමළ සහෝදරයන් සමඟ සාමය උදෙසා ක්‍රියා කළ යුතු වේ. එසේ නොවුවහොත් තව වසර 20 ක් ඇතුලත නැවතත් ලේ වැගිරෙන සටන් ඇතිවනු ඇත.....

## සමාප්ති සටහන

යුද්ධය නිමා කිරීමේ ගෞරවය ලබාදිය යුත්තේ කාහටදැයි යන්න සම්බන්ධව ශ්‍රී ලංකාව තුල බොහෝ දෙනෙක් තවමත් තර්ක කරමින් සිටිති. එම ගෞරවය ලැබිය යුත්තේ මහින්ද රාජපක්‍ෂද, සරත් පොන්සේකාද, නැතහොත් ගෝඨාභය රාජපක්‍ෂද යන්න තවමත් විවාදයට ලක් කෙරේ. යුද්ධය නිමා කිරීම සඳහා මෙම පුද්ගලයින් තම උපරිම දායකත්වය ලබා දුන් බවට කිසිදු සැකයක් නැත. එහෙත් රණවිරුවන්ගේ කැපවීම, පරිත්‍යාගය, දහඩිය හා ඔවුන් හෙලූ රුධිරය නොමැතිවූයේ නම් එම ජයග්‍රහණය සැබැවින්ම අත්පත් කරගත නොහැකි වනු ඇත. එබැවින් ඊලාම් යුද්ධයේදී සටන් වැදුනු රණවිරුවන්ගේ කායික මානසික සෞඛ්‍යය සංරක්ෂණය හා අනාගත සුභසාධනය ගැන බලා ගැනීම ජාතියක් සතු පූණී සදාචාරාත්මක යුතුකමක් හා වගකීමක් වන්නේය.

***වෛද්‍ය රුවන් එම්. ජයතුංග විසින් ලියන ලද War Trauma Experienced by the Sri Lankan Combatants ලිපිය ඇසුරෙනි. පරිවර්තනය ඒ එස් වික්‍රමසිංහ***

